අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 458

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I) සහ 14/2022(II) යටතේ උපලේඛනගත රජයේ නිලධාරීන් සඳහා දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා නොදීමට තීරණය කිරීම.**

උක්ත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සඳහා අධිකරණවල සේවයේ නියුතු උපලේඛනගත රජයේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I) සහ 14/2022(II) යටතේ උපලේඛනගත රජයේ නිලධාරීන් සඳහා දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා නොදීමට 2022.10.06 දින තීරණය කර ඇත.

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හි 04(ක) ඡේදයේ සඳහන් පරිදි එම චක්‍රලේඛය යටතේ නිලධාරීන් සඳහා නිවාඩු ලබා දීමේදී ඒ තුළින් රාජ්‍ය ආයතනවල කාර්යයන් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑමට බාධාවක් නොවන බවට නිවාඩු අනුමත කරන බලධරයා විසින් තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් නිවාඩු අනුමත කළ යුතු වීම.

ii. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් දැනට සේවයේ යෙදෙන නිලධරයන් මඟින් සියලු අධිකරණවල කටයුතු විධිමත්ව කළමනාකරණය කර ගැනීමට අපහසු වීම.

iii. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් බඳවා ගැනීම් අත්හිටුවා තිබීම.

iv. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2022 මඟින් රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 සිට 60 දක්වා අඩු කිරීම මත අධිකරණවල සේවයේ නියුතු සැලකිය යුතු නිලධාරීන් පිරිසක් 2022.12.31 දින සිට විශ්‍රාම යාමට නියමිත බැවින් අධිකරණවල කටයුතු කළමනාකරණය කර ගැනීම තව දුරටත් අපහසු වීම.

02. ඒ අනුව උපලේඛනගත රජයේ නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I) සහ 14/2022(II) යටතේ දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීමෙන් අධිකරණවල කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑමට බාධාවක් නොවන බවට තහවුරු කර ගැනීමට හැකියාවක් නොමැති බව සැලකිල්ලට ගෙන එම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යටතේ උපලේඛනගත රජයේ නිලධාරීන් සඳහා දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා නොදීමට තීරණය කර ඇත.

03. කෙසේ වෙතත් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන යටතේ දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමට ඉහත තීරණය බාධාවක් නොවන බවට අධිකරණ සේවා කොමිෂන් සභාව වැඩිදුරටත් තීරණය කර ඇත.

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2022 නොවැම්බර් මස 09 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12